**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි (ආයතන) සහ පරිපාලන නිලධාරි (විමර්ශන) තනතුරුවලට රාජකාරි ආවරණය කිරිමේ පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම**

1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවය යටතේ අනුමත පරිපාලන නිලධාරි ආයතන හා විමර්ශන තනතුරු සඳහා රාජකාරි ආවරනය කිරිමේ පදනම මත බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද සහිත ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් **අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 04 වන මහල, සෙත්සිරිපාය I වන අදියර, බත්තරමුල්ල** ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"පරිපාලන නිලධාරි** (ආයතන) / (විමර්ශන) **තනතුර සඳහා බඳවා ගැනීම"** ලෙස ලිවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 ඔක්තෝම්බර් මස 10 දින වේ.

   සටහන:- අයදුම්පත ලියාපදිංචි තැපැල මඟින් එවීම අනිවාර්යය අතර, එය තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරු විසින් විඳදරා ගත යුතුය.

2. මෙහි දී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 02 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චය කරනු ලැබේ.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

   3.1. සේවා ගණය අදාල නොවේ
   3.2. මෙම තනතුර රාජකාරි ආවරනය කිරිමේ පදනම මත වන අතර නිත්‍ය තනතුරේ වැටුපට අමතරව කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

   3.3. රාජ්‍ය සේවා පත්වීම් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීති අදාල වේ.

   3.4. තෝරාගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද මුදල් රෙගුලාසි වලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද යටත්විය යුතුය.

4. සුදුසුකම්

   සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ගත ප්‍රධාන කළමණාකරන සහකාර හෝ කළමණාකරන සහකාර සේවයේ (MN -2) i ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු විම.

5. තනතුරට අදාල කාර්යයන්

   5.1. සමෘද්ධි කළමණාකරු හා සමෘද්ධි සංවර්ධන නිලධාරි පෞද්ගලික ලිපි ගොනු වලට අදාල කටයුතු
   5.3. සමෘද්ධි කළමණාකරු හා සමෘද්ධි සංවර්ධන නිලධාරි ශ්‍රේණි උසස්වීම්

   5.4. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු වලට අදාල අධීක්ෂණ රාජකාරි

6. වයස් සීමාව - අදාල නොවේ

7.7.1 බඳවා ගැනීමේ ක්‍රමය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුතුව ආයතන කටයුතු පිළිබඳ මනා දැනුමක් ඇති විධායක ශ්‍රේණියේ නිලධාරියකු හා දීප ව්‍යාප්ත සේවාවක නිලධාරියකුගෙන් යුතුව සමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කරනු ලබන යෝග්‍යතා ඇගයීමකින් අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු රාජකාරි ආවරනය කිරිමේ පදනම මත වසරක කාලයක් සඳහා හෝ පුරප්පාඩු සම්පූර්න වන දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා පරිපාලන නිලධාරි තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

7.2 ලකුණු ලබාදීමේ ක්‍රමය

| අනු අංකය | ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | *සම්මුඛ පරික්ෂණයේදි අංක 1-4 දක්වා පහත සඳහන් ශිර්ෂ යටතේ ප්‍රශ්න 1 බැගින් යොමු කරනු ලබන අතර එක් ප්‍රශ්නයකටලකුණු 5 බැගින් ලබා දෙනු ඇත. | |
| 01 | කාර්යාල කළමනාකරණය | 5 |
| 02 | කාර්යාල ක්‍රම | 5 |
| 03 | ආයතන කාර්ය පටිපාටිය හා කාර්ය පටිපාටික රිති | 5 |
| 04 | රාජ්‍ය මුල්‍ය කළමණාකරනය | 5 |
| 05 | ජ්‍යෙෂ්ඨතාවය | 40 |
| 06 | පළපුරුද්ද | 25(වසරකට ලකුණු 5 බැගින් ) |
| 07 | සම්මුඛ පරීක්ෂණයේ දී දැක්වූ කුසලතා | 15 |
| **මුළු ලකුණු** | | **100** |

සී. ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.